- දුවේ පුතේ''
- අඹ ගස හා දෙබස ගීතය තාලයට ගායනා කරන්න .

ළමයා : අඹ ගෙඩි පිරිලා කදිම යි .
ඔබේ අඹ ගසේ
දුටුව ම අඹ කඩාගන්න
මට හිත දෙන්නේ
අඹ ගස : කඩා ගන්න හරි ම රස යි
ඉදුණු අඹ තිබේ
කාටත් මම අඹ දෙන්නෙමි
කන්නට සිත් සේ
ළමයා : ලේනුන් හා කුරුල්ලන් ද
ඇවිත් නිදහසේ
අඹ කන හැටි මම දුටුවෙමි
සතුටකි දැනුණේ
අඹ ගස : සතුන් ඇවිත් අඹ වාරෙට
ඉඳ අතු අතරේ
දුව පනිමින්, හරි සතුටිනි
මෙහි අඹ කන්නේ
ළමයා : නැති අයටත් දීම හොඳ යි
අපට තිබෙන දේ
අගය කරමි සැමදාමත්
ඔබ කරනා දේ

'දුවේ පුතේ'

- **අඹ ගසක් හා ළමයෙක් අතර දෙබසක් ගොඩනඟා ලියන්න.**

උදා : ළමයා - ආයුබෝවන් යාළුවේ.
අඹ ගස - ආයුබෝවන් පුංචි බබෝ
ළමයා - . . . . . .
අඹ ගස - . . . . . .
ළමයා - . . . . . .
අඹ ගස - . . . . . .
ළමයා - . . . . . .
අඹ ගස - . . . . . .
ළමයා - . . . . . .
අඹ ගස - . . . . . .